*සැ. යු.* - 2023.06.16 දින පළ කරන ලද අංක 2337 *ගැසට් පත්‍රයේ* IV (අ) කොටස පළ නොවීය.

# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

**අංක 2,338 - 2023 ජූනි මස 23 වැනි සිකුරාදා - 2023.06.23**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී.)

# II කොටස – අධිකරණ

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකට ම අයත් එක් එක් භාෂාවකට වෙන වෙන පිටු අංක යොදා ඇත.)


| | පිටුව |
|---|---|
| සම්මත වූ පනත් ... ... ... ... | — |
| පනත් කෙටුම්පත් ... ... ... ... | — |
| ශ්‍රේෂ්ඨාධිකරණයේ දැන්වීම් ... ... ... ... | — |
| ශ්‍රී ලංකා ඇපැල් උසාවියේ දැන්වීම් ... ... ... | — |
| ශ්‍රේෂ්ඨාධිකරණයේ අපරාධ නඩු සැසි පිළිබඳ නිවේදන ... | — |
| දිසා අධිකරණ හා මහෙස්ත්‍රාත් අධිකරණ දැන්වීම් ... | — |
| වස්තු භංගත්ව නඩු පිළිබඳ දැන්වීම් ... ... ... | — |
| පිස්කල් මාර්ෂල්වරුන්ගේ පත් කිරීම් ... ... ... | — |
| පිස්කල් විකිණීම් ... ... ... | 390 |
| බූදල් නඩු පිළිබඳ දැන්වීම් ... ... ... ... | — |
| නීති අධ්‍යාපන සභාවේ දැන්වීම් ... ... ... | — |
| නොතාරිස් ලැයිස්තු ... ... ... ... | — |
| විවිධ දැන්වීම් ... ... ... ... | 393 |


*සැ. යු.* - ආයුර්වේද (සංශෝධන) පනත් කෙටුම්පත 2023 ජූනි මස 09 වැනි දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* II වැනි කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී.

**සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

**වැදගත් නිවේදනයයි**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* අවසන් පිටුවේ සෑම මාසයක ම මුල් සතියේ දී පළකරන නිවේදන භාරගන්නා දිනයන් සහ වේලාවන් පිළිබඳව මින් අවධානය යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළකිරීම සඳහා දැන්වීම් භාරගැනීම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනයට සති දෙකකට පෙර සිකුරාදා දිනයෙහි දහවල් 12.00 ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තු, විභාග, ටෙන්ඩර් සහ වෙන්දේසි පිළිබඳ දැන්වීම්වල අවසන් දින සහ වේලාවන් ඒ පිළිබඳව උනන්දුවක් දක්වන අයට ප්‍රමාණවත් කාලවේලාවක් ලැබෙන පරිදි යොදාගත යුතු බවට, සියලු ම දෙපාර්තමේන්තු, සංස්ථා සහ මණ්ඩල යනාදිය වගබලාගත යුතු බව මින් අවධාරණය කෙරේ. පළකිරීම සඳහා එවනු ලබන සෑම දැන්වීමක් ම තනි පැත්තේ පමණක් පැහැදිලිව පිටපත් කළ යුතු ය. නිරවද්‍යතාවය පිළිබඳව කරන විමසීම් සහ පැමිණිලි *ගැසට් පත්‍රය* පළ වූ දින සිට තෙමසකට පසුව භාරගනු නොලැබේ.

*ගැසට් පත්‍රයේ* පළකරන සෑම දැන්වීමක් ම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනට සති දෙකකට පෙර (එනම්, 2023 ජූලි මස 14 වැනි දින පළකරන *ගැසට් පත්‍රයේ* දැන්වීම් 2023 ජූනි මස 30 වැනි දින දහවල් 12.00 ට හෝ ඊට පෙර) තැපෑලෙන් හෝ ගෙනවිත් රජයේ මුද්‍රණාලයට භාරදිය යුතු ය.

**206 අංක 19 දරන ඉලෙක්ට්‍රොනික ගනුදෙනු පනත - 9 වැනි වගන්තිය**

''යම් ප්‍රකාශනයක්, රීතියක්, නියෝගයක්, නියමයක්, අතුරු ව්‍යවස්ථාවක්, නිවේදනයක් හෝ වෙනත් කිසිවක් *ගැසට් පත්‍රයේ* පළකළ යුතු බවට යම් පනතකින් හෝ නීති ප්‍රඥප්තියකින් විධිවිධාන සලස්වා ඇති අවස්ථාවක, ඒ රීතිය, නියෝගය, නියමය, අතුරු ව්‍යවස්ථාව, නිවේදනය හෝ වෙනත් දෙය ඉලෙක්ට්‍රොනික ස්වරූපයේ වන *ගැසට් පත්‍රයක* පළ කරනු ලැබුවහොත් ඒ විධිවිධානය සම්පූර්ණ කර ඇත්තාක් සේ සැළකිය යුතු ය.''

**ගංගානි ලියනගේ,**
රජයේ මුද්‍රණාලයාධිපති.

2023 ජනවාරි මස 02 වැනි දින,
කොළඹ 08,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ දී ය.

මෙම *ගැසට් පත්‍රය* *www.documents.gov.lk* වෙබ් අඩවියෙන් බාගත කළ හැක.

# පිස්කල් විකිණීම්

## කුලියාපිටිය දිසා අධිකරණයේ දී ය

### වෙන්දේසියේ විකිණීමේ දැන්වීමයි

හලාවත, කොටුව පාර, අංක 17 දරන ස්ථානයෙ හි ශාඛා කාර්යාලයක් සහ/හෝ ව්‍යාපාරික ස්ථානයක් ඇත්තා වූ, ශ්‍රීමත් චිත්තම්පලම් ඒ. ගාර්ඩිනර් මාවත, තැ.පෙ. 2085, කොළඹ 02 දරන ස්ථානයේ සිය ලියාපදිංචි ප්‍රධාන කාර්යාලය පිහිටි,

ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා බැංකුව,
ශ්‍රීමත් චිත්තම්පලම් ඒ. ගාර්ඩිනර් මාවත,
තැ. පෙ. 2085, කොළඹ 02.

හලාවත දිසා අධිකරණ
නඩු අංකය : 5086/MB
ඇස්කිසි අංකය : 4/2023

*...............පැමිණිලිකරු.*

*එදිරිව*

මහවත්තගේ චමිලා දිනේෂ් සුසන්නි,
මගුලාගම,
මගුලාගම.

*.................විත්තිකාරිය.*

**අගනා දේපළ වෙන්දේසියක්**

වයඹ පළාතේ, කුරුණෑගල දිස්ත්‍රික්කයේ, උතුරු යටිකහ කෝරළේ, කටුගම්පල හත් පත්තුවේ පඩුවස්නුවර ප්‍රාදේශීය සභා සහ පඩුවස්නුවර නැගෙනහිර ප්‍රාදේශීය ලේකම් සීමාවේ, මගුලාගම ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ මගුලාගම ග්‍රාමයෙහි පිහිටි,

''කරුවලගහමුලහේන සහ අහස්දියවල වත්ත සහ කෝන්ගහමුලහේන *හෙවත්* අහස්දියවල වත්ත දැන් හේනෙකැල්ල එස්ටේට්''

**වර්ෂ 2018 ක්වූ මාර්තු මස 28** ඇතුළත් කරන ලද නඩු තීන්දුව මත පැමිණිල්ලේ සඳහන් සම්පූර්ණ මුදල නඩු ගාස්තු, නෛතික පොලිය, වෙන්දේසි ගාස්තු, අයකර ගැනීමට පැමිණිලිකරුට අයිතියක් ඇති බවට තීන්දු ප්‍රකාශ කර ඇති බැවින් එකී සහන ලබා ගැනීම සඳහා විත්තිකරුට අයත් කුලියාපිටිය අධිකරණයේ රෙජිස්ට්‍රාර්වරයා විසින් තහනමට ගෙන ඇති මෙහි පහත උපලේඛනයේ සවිස්තරව දක්වා ඇති දේපළ

**වර්ෂ 2023 ක්වූ ජූලි මස 20** වැනි දින එම දේපළ පිහිටි ස්ථානයේ දී **ප. ව. 1.00**ට ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

මෙම දේපළ ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා බැංකුවට උකස්කර ඇත්තේ මහවත්තගේ චමිලා දිනේෂ් සුසන්නි යන අය විසිනි.

*ඉඩමට පිවිසීම.-*

හලාවත නගරයේ සිට මාදම්පේ-කුරුණෑගල පාරේ ගොස් කුලියාපිටිය බස් නැවතුම්පල පසුකර ප්‍රධාන මංසන්ධියෙන් හෙට්ටිපොල පාරේ කි. මී. 8 1/2 ගොස් මුණමල්දෙනිය හන්දියෙන් දකුණට හැරී කටුපොත පාරේ කි. මී. 5ක් පමණ ගියවිට සුසාන භූමියට පෙර දකුණු පැත්තේ ඇති පාරේ මීටර් 250ක් ගියවිට දකුණු පැත්තේ පිහිටි ඉඩම එනම් ඉහත සඳහන් දැන් හේනෙකැල්ල එස්ටේට් නමැති ඉඩම පිහිටා ඇත.

පිස්කල් වෙන්දේසියේ විකිණීමේ කොන්දේසි :

* වෙන්දේසිය වෙනුවෙන් උසාවියට ගෙවිය යුතු ගාස්තු
* පළාත් පාලන ආයතන බදු වශයෙන් ගැණුම් මිලෙන් 1%
* වෙන්දේසි කටයුතු සඳහා වන මුදල් සහ ප්‍රචාරණ ගාස්තු
* විකිණීමේ සහතිකය සඳහා මුද්දර ගාස්තු
* ඉඩම මිල දී ගැනීමට ඉල්ලුම් කරන ලද වටිනාකමෙන් 25%ක මුදලක් වෙන්දේසි කරනු ලබන අවස්ථාවේ දී ම කුලියාපිටිය දිසා අධිකරණයේ පිස්කල්වරයා වෙත ගෙවිය යුතු වන අතර, ඉතිරි 75%ක මුදල වෙන්දේසි දින සිට එළඹෙන තිස් වෙනි දිනයේදී හෝ එදිනට පෙර ගෙවිය යුතු ය.

* අදාළ දේපළ පිස්කල් වෙන්දේසියේ විකිණීමේ කොන්දේසිවලට ඇතුළත් වේ.

මේ පිළිබඳ වැඩිදුර තොරතුරු හලාවත, කොටුව පාර, අංක 17 දරන ස්ථානයේ පිහිටි ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා බැංකුවේ ශාඛා කාර්යාලයෙන් ලබාගත හැක.

දුරකථන අංක : 032-2222594/032-2222666/32-7388151
ෆැක්ස් : 032-2222594

හිමිකම් හා වෙනත් අදාළ විස්තර ඉහත ලිපිනයෙන් ලබාගත හැක.

ඉහත සඳහන් කරන ලද පරිදි මුදල් දින 30 ඇතුළත නොගෙවුවහොත් දැනටමත් ගෙවා ඇති ගැණුම් මිලෙන් 25% මුදල් ආපසු නොගෙවීමට සහ නැවත දේපළ විකිණීමට බැංකුවට අයිතිය ඇත.

**උපලේඛනය**

වයඹ පළාතේ, කුරුණෑගල දිස්ත්‍රික්කයේ, උතුරු යටිකහ කෝරළේ, කටුගම්පොල හත් පත්තුවේ, පඬුවස්නුවර ප්‍රාදේශීය සභා සීමාව තුළ සහ පඬුවස්නුවර නැගෙනහිර ප්‍රාදේශීය ලේකම් බල සීමාව තුළ, මගුලාගම ග්‍රාම නිලධාරී වසම තුළ, මගුලාගම යන ග්‍රාමයෙහි පිහිටි කුරුණෑගල ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාල බල සීමාව තුළ පිහිටි කරුවලගහමුලහේන සහ අහස්දියවල වත්ත සහ කෝන්ග හමුලහේන *හෙවත්* අහස්දියවල වත්ත දැන් හේනෙකැල්ල එස්ටේට් යනුවෙන් හඳුන්වනු ලබන ඉඩමට වර්ෂ 1999.08.27 දින එම්. ජේ. ගෝමස් මිනින්දෝරුතැන විසින් මැන සකස් කරන ලද අංක 3731 දරන පිඹුර ප්‍රකාර කැබලි අංක 114 දරන ඉඩමට මායිම්, උතුරට : ඉහත කී අංක 3731 දරන පිඹුරෙහි ලොට් 115 ද, නැගෙනහිරට - ඉහත කී අංක 3731 දරන පිඹුරෙහි ලොට් 151 දරන මීටර් 9ක් පළල පාර ද, දකුණට : ඉහත කී අංක 3731 දරන පිඹුරෙහි ලොට් 113 ද සහ බටහිරට : ඉහත කී අංක 3731 දරන පිඹුරෙහි ලොට් 109 ද, යන මායිම් තුළ පිහිටි පර්චස් පහලොවක (පර්. 15) වපසරියකින් යුතු මෙම ඉඩම හා ඊට අයත් නිවාස ගොඩනැගිලි ගහකොළ පලතුරු සියලු දේ ද ඉහත කී අංක 3731 දරන පිඹුරෙහි සඳහන් ලොට් 148, 149A, 149B, 150, 151, 152 දරන මාර්ගයන් හි අයිතිය සමග වේ. මෙය කුරුණෑගල ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ආර් 14/58 හි ලියාපදිංචි කර ඇත.

අධිකරණයේ අණ පරිදි,

එච්. පී. ඩී. අබේරත්න,
රෙජිස්ට්‍රාර්/නියෝජ්‍ය පිස්කල්,
සාම විනිසුරු,
දිසා අධිකරණය - කුලියාපිටිය.

06-490/1

---

**කුලියාපිටිය දිසා අධිකරණයේ දී ය**

වෙන්දේසියේ විකිණීමේ දැන්වීමයි

හලාවත දිසා අධිකරණ
නඩු අංකය : 5042/MB
ඇස්කිසි අංකය : 5/2023

හලාවත, කොටුව පාර, අංක 17 දරන ස්ථානයෙහි ශාඛා කාර්යාලයක් සහ/හෝ ව්‍යාපාරික ස්ථානයක් ඇත්තා වූ ශ්‍රීමත් චිත්තම්පලම් ඒ. ගාර්ඩිනර් මාවත, තැ.පෙ. 2085, කොළඹ 02 දරන ස්ථානයේ සිය ලියාපදිංචි ප්‍රධාන කාර්යාලය පිහිටි,

ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා බැංකුව,
ශ්‍රීමත් චිත්තම්පලම් ඒ. ගාර්ඩිනර් මාවත,
තැ. පෙ. 2085, කොළඹ 02.

................*පැමිණිලිකරු.*

*එදිරිව*

විජේසිංහ පුංචි කුමාරසිංහ,
"තාරුක'' මෝටර්ස්,
මගුලාගම,
මගුලාගම.

.................*විත්තිකාරිය.*

### අගනා දේපළ වෙන්දේසියක්

වයඹ පළාතේ, කුරුණෑගල දිස්ත්‍රික්කයේ, උතුරු යටිකහ කෝරළේ, කටුගම්පල හත් පත්තුවේ පඬුවස්නුවර ප්‍රාදේශීය සභා සහ පඬුවස්නුවර නැගෙනහිර ප්‍රාදේශීය ලේකම් සීමාවේ, මගුලාගම ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ මගුලාගම ග්‍රාමයෙහි පිහිටි ''කරුවලගහමුලහේන සහ අහස්දියවල වත්ත සහ කෝන්ගහමුලහේන *හෙවත්* අහස්දියවල වත්ත දූන් හේනෙකැල්ල එස්ටේට්''

**වර්ෂ 2018 ක් වූ ජනවාරි මස 10** ඇතුළත් කරන ලද නඩු තීන්දුව මත පැමිණිල්ලේ සඳහන් සම්පූර්ණ මුදල නඩු ගාස්තු, නෛතික පොලිය, වෙන්දේසි ගාස්තු, අයකර ගැනීමට පැමිණිලිකරුට අයිතියක් ඇති බවට තීන්දු ප්‍රකාශ කර ඇති බැවින් එකී සහන ලබා ගැනීම සඳහා විත්තිකරුට අයත් කුලියාපිටිය අධිකරණයේ රෙජිස්ට්‍රාර්වරයා විසින් තහනමට ගෙන ඇති මෙහි පහත උපලේඛනයේ සවිස්තරව දක්වා ඇති දේපළ.

**වර්ෂ 2023 ක් වූ ජූලි මස 20 වැනි දින** එම දේපළ පිහිටි ස්ථානයේ දී **පෙ. ව. 11.00** ට ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

මෙම දේපළ ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මුල්‍ය සංස්ථා බැංකුවට උකස්කර ඇත්තේ විජේසිංහ පුංචි කුමාරසිංහ යන අය විසිනි.

හලාවත නගරයේ සිට මාදම්පේ-කුරුණෑගල පාරේ ගොස් කුලියාපිටිය බස් නැවතුම්පල පසුකර ප්‍රධාන මංසන්ධියෙන් හෙට්ටිපොල පාරේ කි. මී. 8 1/2 ගොස් මුණමල්දෙනිය හන්දියෙන් දකුණට හැරී කටුපොත පාරේ කි. මී. 5ක් පමණ ගියවිට (සුසාන භූමිය අසල) දකුණු පැත්තේ ඇති ''තාරුක මෝටර්'' පිහිටි ඉඩම එනම් ඉහත සඳහන් දූන් හේනෙකැල්ල එස්ටේට් නමැති ඉඩම පිහිටා ඇත.

*පිස්කල් වෙන්දේසියේ විකිණීමේ කොන්දේසි :*

* වෙන්දේසිය වෙනුවෙන් උසාවියට ගෙවිය යුතු ගාස්තු
* පළාත් පාලන ආයතන බදු වශයෙන් ගැණුම් මිලෙන් 1%
* වෙන්දේසි කටයුතු සඳහා වන මුදල් සහ ප්‍රචාරණ ගාස්තු
* විකිණීමේ සහතිකය සඳහා මුද්දර ගාස්තු
* ඉඩම මිලදී ගැනීමට ඉල්ලුම් කරන ලද වටිනාකමෙන් 25%ක මුදලක් වෙන්දේසි කරනු ලබන අවස්ථාවේ දී ම කුලියාපිටිය දිසා අධිකරණයේ පිස්කල්වරයා වෙත ගෙවිය යුතු වන අතර, ඉතිරි 75%ක මුදල වෙන්දේසි දින සිට එළඹෙන තිස් වෙනි දිනයේදී හෝ එදිනට පෙර ගෙවිය යුතු ය.
* අදාළ දේපළ පිස්කල් වෙන්දේසියේ විකිණීමේ කොන්දේසිවලට ඇතුළත් වේ.

මේ පිළිබඳ වැඩිදුර තොරතුරු හලාවත, කොටුව පාර, අංක 17 දරන ස්ථානයේ පිහිටි ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා බැංකුවේ ශාඛා කාර්යාලයෙන් ලබාගත හැක.

දුරකථන අංක : 032-2222594/032-2222666/32-7388151
ෆැක්ස් : 032-2222594

හිමිකම් හා වෙනත් අදාළ විස්තර ඉහත ලිපිනයෙන් ලබාගත හැක.

ඉහත සඳහන් කරන ලද පරිදි මුදල් දින 30 ඇතුළත නොගෙවුවහොත් දැනටමත් ගෙවා ඇති ගැණුම් මිලෙන් 25% මුදල් ආපසු නොගෙවීමට සහ නැවත දේපළ විකිණීමට බැංකුවට අයිතිය ඇත.

### උපලේඛනය

වයඹ පළාතේ, කුරුණෑගල දිස්ත්‍රික්කයේ, උතුරු යටිකහ කෝරළේ, කටුගම්පොල හත් පත්තුවේ, පඬුවස්නුවර ප්‍රාදේශීය සභා සීමාව තුළ සහ පඬුවස්නුවර නැගෙනහිර ප්‍රදේශීය ලේකම් බල සීමාව තුළ, මගුලාගම ග්‍රාම නිලධාරි වසම තුළ, මගුලාගම යන ග්‍රාමයෙහි පිහිටි කුරුණෑගල ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාල බල සීමාව තුළ පිහිටි කරුවලගහමුලහේන සහ අහස්දියවල වත්ත සහ කෝන්ගහමුලහේන *හෙවත්* අහස්දියවල වත්ත දූන් හේනෙකැල්ල එස්ටේට් යනුවෙන් හඳුන්වනු ලබන ඉඩමට වර්ෂ 1999.08.27 දින එම්. ජේ. ගෝමස් මිනින්දෝරු තැන විසින් මැන සකස් කරන ලද අංක 3731 දරන පිඹුර ප්‍රකාර කැබලි අංක 10 දරන ඉඩමට මායිම්, උතුරට : මුණමල්දෙනිය සිට කටුපොත දක්වා දිවෙන මාර්ගය ද, නැගෙනහිරට : ලොට් 09 ද, දකුණට : ලොට් 36 ද සහ බටහිරට : ලොට් 152 දරන පාර ද, යන මායිම් තුළ පිහිටි පර්චස් පහළොවයි දශම දෙකක (පර්. 15.2) වපසරියකින් යුතු මෙම ඉඩම හා ඊට අයත් නිවාස ගොඩනැගිලි ගහකොළ පලතුරු සියලු දේ ද ඉහත කී අංක 3731 දරන පිඹුරෙහි සඳහන් ලොට් 148, 149A, 149B, 150, 151, 152 දරන මාර්ගයන් හි අයිතිය සමග වේ. මෙය කුරුණෑගල ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ආර් 05/27 හි ලියාපදිංචි කර ඇත.

අධිකරණයේ අණ පරිදි,

එච්. පී. ඩී. අබේරත්න,
රෙජිස්ට්‍රාර්/නියෝජ්‍ය පිස්කල්,
සාම විනිසුරු,
දිසා අධිකරණය - කුලියාපිටිය.

06-490/2

# විවිධ දැන්වීම්

## සිංහලේ ජාතික සංවිධානය සංස්ථාගත කිරීම සඳහා වූ පනතකි

නීතිඥ ප්‍රේම්නාත් සී. දොලවත්ත වන මම, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුවේ අංක 53 (1) දරන ස්ථාවර නියෝගය යටතේ "සිංහලේ ජාතික සංවිධානය සංස්ථාගත කිරීම සඳහා වූ පනතකි'' යනුවෙන් හැඳින්වෙන පනත් කෙටුම්පතක් පාර්ලිමේන්තුවේ දී ඉදිරිපත් කිරීමට අදහස් කරන බව මෙයින් දැනුම් දෙමි.

පනත් කෙටුම්පතේ අරමුණු වනුයේ පහත සඳහන් පොදු පරමාර්ථවලින් යුක්ත වන්නා වූ එකී පදනම සංස්ථාගත කිරීමයි :-

(අ) ශීල ව්‍යාපාර, භාවනා වැඩසටහන්, බෝධිපූජා ඇතුළු ආගමික වැඩසටහන් සංවිධානය කිරීම, මෙහෙයවීම හා ක්‍රියාත්මක කිරීම තුළින් දැහැමි සමාජයක් ගොඩනැගීම ;

(ආ) ශාසනික හා ජාතික විපත් හඳුනා ගනිමින් ඒවා පිටු දැකීමට සුදුසු පියවර ගැනීම ; සහ

(ඇ) ගිහි පැවිදි දෙපක්ෂයේ ම දේශීය හා විදේශීය ධර්ම දූතයන් පුහුණු කිරීම,

යනාදිය වේ.

නීතිඥ ප්‍රේම්නාත් සී. දොලවත්ත,
පාර්ලිමේන්තු මන්ත්‍රී,
කොළඹ දිස්ත්‍රික්කය.

06-386

---

## ඉසිවර සංවර්ධන, සමාජ සත්කාරක හා පුණ්‍යාධාර පදනම සංස්ථාගත කිරීම සඳහා වූ පනතකි

මධුර විතානගේ වන මම, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුවේ අංක 53 (1) දරන ස්ථාවර නියෝගය යටතේ "ඉසිවර අලුත්ගමගේ සංවර්ධන, සමාජ සත්කාරක හා පුණ්‍යාධාර පදනම සංස්ථාගත කිරීම සඳහා වූ පනතකි'', යනුවෙන් හැඳින්වෙන පනත් කෙටුම්පතක් පාර්ලිමේන්තුවේ දී ඉදිරිපත් කිරීමට අදහස් කරන බව මෙයින් දැනුම් දෙමි.

පනත් කෙටුම්පතේ අරමුණු වනුයේ පහත සඳහන් පොදු පරමාර්ථවලින් යුක්ත වන්නා වූ එකී පදනම සංස්ථාගත කිරීමයි :-

(අ) ආධාර ලැබීමට සුදුසු ශිෂ්‍ය ශිෂ්‍යාවන් සඳහා විශේෂ උපකාර සේවා පැවැත්වීම සහ ශිෂ්‍යත්ව, පුස්තකාල පහසුකම් සහ අධ්‍යාපන කටයුතු සඳහා අවශ්‍ය වෙනත් ආධාර ලබා දීම ;

(ආ) කුඩා හා මධ්‍යම පරිමාණ කර්මාන්ත හා ව්‍යාපාර සේවා නියුක්තිකයින් සංවිධානගතකොට ඔවුන්ගේ අනාගත අභිවෘද්ධිය උදෙසා කටයුතු කිරීම ; සහ

(ඇ) ළමා හා කාන්තා සංවර්ධනය සඳහා වූ සමාජ සජීවිකරණ වැඩ සටහන් නිර්මාණය කිරීම හා ක්‍රියාත්මක කිරීම ඒ සඳහා අධ්‍යාපන හා පුහුණු වැඩ සටහන් ක්‍රියාත්මක කිරීම ;

යනාදිය වේ.

මධුර විතානගේ,
පාර්ලිමේන්තු මන්ත්‍රී,
කොළඹ දිස්ත්‍රික්කය.

06-387

## බුද්ධශ්‍රාවක සුරක්ෂිතා මධ්‍යස්ථානය සංස්ථාගත කිරීම සඳහා වූ පනතකි

මධුර විතානගේ වන මම, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුවේ අංක 53 (1) දරන ස්ථාවර නියෝගය යටතේ "බුද්ධශ්‍රාවක සුරක්ෂිතා මධ්‍යස්ථානය සංස්ථාගත කිරීම සඳහා වූ පනතකි'', යනුවෙන් හැඳින්වෙන පනත් කෙටුම්පතක් පාර්ලිමේන්තුවේ දී ඉදිරිපත් කිරීමට අදහස් කරන බව මෙයින් දැනුම් දෙමි.

පනත් කෙටුම්පතේ අරමුණු වනුයේ පහත සඳහන් පොදු පරමාර්ථවලින් යුක්ත වන්නා වූ එකී මධ්‍යස්ථානය සංස්ථාගත කිරීමයි :-

(අ) පිළිකා ආසාදිත භික්ෂු භික්ෂුණීන් වහන්සේලා මෙන් ම අනෙකුත් සියලු ආගමික නායකයින් සඳහා කායික මානසික සුව පහසුව සැලසීම ;

(ආ) පිළිකා ආසාදිත භික්ෂු භික්ෂුණීන් වහන්සේලා මෙන් ම අනෙකුත් සියලු ආගමික නායකයින් සඳහා ම වෙන්වුන ස්ථානයක් ලෙස පවත්වාගෙන යෑම ; සහ

(ඇ) පිළිකා ආසාදිත භික්ෂු භික්ෂුණීන් වහන්සේලා මෙන් ම අනෙකුත් සියලු ආගමික නායකයින් සඳහා මහරගම අපේක්ෂා රෝහලේ ප්‍රතිකර්ම ලබන කාලය තුළ දී නේවාසිකව සියලුම ඇප උපස්ථාන සහිත ව වැඩවිසීම සඳහා පහසුකම් සලසා දීම;

යනාදිය වේ.

මධුර විතානගේ,
පාර්ලිමේන්තු මන්ත්‍රී,
කොළඹ දිස්ත්‍රික්කය.

06-388

---

## ඇදහිලිවන්තයන්ගේ නැගෙනහිර සභාව සංස්ථාගත කිරීම සඳහා වූ පනතකි

ප්‍රේම්නාත් සී. දොලවත්ත වන මම, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝගවල අංක 53 (1) දරන ස්ථාවර නියෝගය යටතේ "ඇදහිලිවන්තයන්ගේ නැගෙනහිර සභාව සංස්ථාගත කිරීම සඳහා වූ පනතකි'', යනුවෙන් හැඳින්වෙන පනත් කෙටුම්පතක් පාර්ලිමේන්තුවේ දී ඉදිරිපත් කිරීමට අදහස් කරන බව මෙයින් දැනුම් දෙමි.

පනත් කෙටුම්පතේ අරමුණු වනුයේ පහත සඳහන් පොදු පරමාර්ථවලින් යුක්ත වන්නා වූ එකී පදනම සංස්ථාගත කිරීමයි :-

01. කිතුනු ඇදහිලිවන්තයන්ගේ ප්‍රයෝජනය සඳහා, සුදුසු සෑම ස්ථානයක ම සභාවට අයත් වන්නා වූ පල්ලි, පිහිටුවා ඒවා පරිපාලනය කිරීම ;

02. කිතුනු ඇදහිලිවන්තයන්ගේ ආගමික හා වන්දනා කටයුතු සඳහා අවශ්‍ය වන්නා වූ රැස්වීම් පහසුකම්, හැකි සෑම අවස්ථාවක දී මෙන් ම හැකි සෑම ස්ථානයකදී ම ඔවුනට සපයාදීම ;

03. සංස්ථාපිත මණ්ඩලයේ අරමුණු ක්‍රියාත්මක කිරීම සඳහා, ලෝකයේ ඕනෑම ප්‍රදේශයක ශාඛා, මධ්‍යස්ථාන සහ කේන්ද්‍රස්ථාන විවෘත කිරීම, ගොඩනැගීම සහ ඒවා සඳහා අවශ්‍ය පහසුකම් සපයා දීම ;

04. ක්‍රිස්තියානි ධර්මය පිළිබඳ දැනුම ලබා දීම සඳහා බයිබල් පාසල්, විද්‍යාල, දේශන ශාලා සහ පුහුණු මධ්‍යස්ථාන පිහිටුවීම, පවරා ගැනීම සහ ඒවා පවත්වාගෙන යාම ;

යනාදිය වේ.

නීතිඥ ප්‍රේම්නාත් සී. දොලවත්ත,
පාර්ලිමේන්තු මන්ත්‍රී,
කොළඹ දිස්ත්‍රික්කය.

06-389

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.